# හිටිවන අන්දරේලා






අන්දරේ සිහි වන්නට දැන් ඇත්තේ ඔහුගේ ගම් පළාතේ ඉදිකරන ලද ස්මාරකය සහ ඩී වී ද ලැනරෝල් ලියාපු පොත පමණකි. තවත් අය ලියූ පොත් ද ඇත .

සැබෑ අන්දරේ මහනුවර රජවාසල පමණක් නොවා රට වැසියාද විනෝදයෙන් පුබුදු කරවීමට සමත් විකටයෙක් විය. මහදැනමුත්තා හා කැකිල්ලේ වැනි කල්පිත චරිත මවන ලද්දේ රජ වාසල කවටයා ඇසුරු කරගෙන යයි අනුමාන කළ හැකිය.

සිංහලයාගේ - විශේෂයෙන් සිංහල ගැමියාගේ හාස්‍යය උපහාසය යන දෙකම ඔහුගේ දිවි බර සැහැල්ලු කරන  මං වූ බවද කිව යුතුය. පසුව ජනප්‍රිය වූ සොකරි සහ කෝලම් ඔස්සේ මේ හාස්‍යයත් උපහාසයත් ජනිත කිරීමට සමත් වූ සිංහලයා විශේෂයෙන් කෝලම මගින් බලවතුන් සිනාවට ලක් කිරීමට පසුබට නොවීය.

සිංහල චිත්‍රපටය ඇරඹීමට පෙර දෙමළ චිත්‍රපටවල සිටි චරිත නරඹා සිනාසුණ අවදියක්ද විය. එඩී ජයමාන්න බඳු විකට නළුවන් වේදිකාවට හා රිදී තිරයට පිවිසියේ ඔවුන් අනුක-රණයයෙනි.

ගුවන් විදුලියෙන් ජනප්‍රිය වූ අමාරිස් අයියා ඇතුළු පිරිස ඉන් එහාට ගිය බවක් නොපෙ-නෙයි.

ඉන් එහාට යයි මා කියන්නේ වේදිකාවට ය. මේ රටේ ඉතා ජනප්‍රිය හා ප්‍රචලිත වින්දන ක්‍රමයක් බව ප්‍රාන්ත නගර වල වාර්ෂිකව පැවැත්වෙන විකට සැණකෙළි අනුව පෙනී යන්නකි. යටත් පිරිසෙයින් මෙල්බර්න් නුවර පවත්වනු ලබන විකට සැණකෙළියට එංගලන්තය හා ඇමරිකාව ඇතුළු රටවල් කිහිපයක නම් දැරූ ශිල්පීන් එන බවද කිව යුතුය. ගැහැනු හා පිරිම දෙගොල්ලම. ඔවුන් ප්‍රේක්ෂකයා පිනවන්නේ රංගනයෙන් නොව වචන මගින්ය. එක්තරා ප්‍රමාණයකට ආංගික හා සාත්වික අභිනයද යොදා ගැනීම බොහෝ දෙනා අනුගමනය කරන පිළිවෙලය.

ආංගික අභිනය අතින් විශේෂ දක්ෂතාවක් පළ කළ කිහිප දෙනෙක් මෑත යුගයේ ශ්‍රී ලංකාවේ සිටියහ. මට මතක් වන දෙදෙනෙක් ඇත. ආචාර්ය සාලමන් ෆොන්සේකා හා විමල කුමාර් ද කොස්තා. කොස්තා සමග "ගොඩෝ එනකං" නාට්‍යයේ පෙනී සිටි අනෙක් නළුවාද ඒ හැකියාව පළ කළ බව මට මතකය.

මා දන්නා තරමට මේ ඉතිහාසය ගෙන හැර පෑවේ පසුගිය දා "සිලෝන් ඩේලි නිව්ස්" පත්තරයේ මා දුටු පුවතක් නිසාය. හිටිවන අන්දරේලා පස් දෙනෙක් හෝ හය දෙනෙක්. ඔවුන් අතර රූමත් කාන්තාවක්ද වූවාය.

ප්‍රජාතන්ත්‍රවාදයේ අසීමිත ආශිර්වාදය භුක්ති විඳින ශ්‍රී ලංකාව බඳු රටකට මේ නව ප්‍රවණතාව අතිශය කාලෝචිත වූවක් බව කිව යුතුය. මා එතෙක් හිතාගෙන හිටියේ ශීඝ්‍ර සංවර්ධන ව්‍යායාමය නිසා ශ්‍රී ලාංකිකයාට හිනා වන්නට නම් ඉස්පාසුවක් නැත කියාය.

ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ ආදිශිෂ්‍යයන්ගේ සන්දර්ශනය හා කෙටි නාට්‍ය උළෙලක දෙකකදීත් ප්‍රේක්ෂකයන්ගේ සිනා ගැන්වීමේ සමතෙක් දුටු මම ඔහුටත් හිටිවන අන්දරේ කෙනකු ලෙස වැදගත් මෙහෙයක් ඉටු කළ හැකි බව මගේ ලිපියක දෙකක සඳහන් කළ බ වමට මතකය. පුද්ගලිකවම ඒබ ව කීවත් එය ඔහුගේ හිතට නොවැටුණ බ වමට කිව හැකිය. ඔහු මා හඳුනන නළුවෙක් නොවේ.

ඔහුගේ නම විපුල් නයනානන්ද  ය. ඔහු ඇතුළු තව කිහිප දෙනෙක් හෝ මව් බිමෙන් ලැබෙන ආදර්ශය අනුව ක්‍රියාත්මක විය යුත්තෝය.

මා එය අවධාරණය කරන්නේ යශෝධරා සහ ඇගේ සැමියා හැරුණ විට දැන් මෙල්බර්න් නුවර නාට්‍යකරුවන් නිහඬව සිටින නිසාය. කණිෂ්ක රාජපක්ෂ පමණක් යමක් කරන්නට තැත් කරයි. ගාමිණී රණසිංහ අජිත් ද සිල්වා සහ නන්දසිරි ද සිල්වා බඳු අන් සියලු දෙනාම වේදිකාව අත්හැර දමා ගිහිල්ලාය. ආයෙත් වේදිකාවට ගොඩවදින පාටක්ද නැත.

මට මතක් වන්නේ දැනට වසර දොළහකටත් ඉස්සර සමන්ත වීරරත්න ඇතුළු පිරිසක් ඉදිරිපත් කළ නාට්‍යයයි. එහි ප්‍රධාන චරිතයක් අප අතර සිටින සමාජ සේවිකාවක උපහාසයට පත් කළ ආකාරය සිත්ගන්නා සුලු විය. ගායකයකු වශයෙන් නමක් දිනා සිටි සමන්ත තමාගේම ගී තැටියක් නිකුත් කළේ යට කී නාට්‍යයෙන් පසුවය.

මෙබඳු තරුණයන් හා මෝරපු උදවියත් නිහඬව සිටීමට හේතුව කියන්නට මට නොහැකිය. රෙසායන්නට මට අයිතියක්ද නැත . එහෙත් හැකියාව සහිත දෙතුන් දෙනකු හෝ "හිටිවන අන්දරේලා" වශයෙන් සිය හැකියා ඔප මට්ටම් කරගන්නේ නම් බහු සංස්කෘතික ඕසට්‍රේලියාව තුළ අනෙක් ජනකොටස් අතරට යාමටද ඔවුන් සමත්වනු නිසැකය. මෙරට පොදු සංස්කෘතික ක්‍රියාවලියට එක්වීමේ ප්‍රභල මාධ්‍යයක්ද ඔවුන් විසින් සකස් කරනු ලබන්නේය.

ශ්‍රී ලංකාවේ අන්දරේලාට ඊටත් වඩා ඉඩ ප්‍රස්ථා ලද හැකි බව කිව යුතුය. මේ දක්වා ශ්‍රී ලංකාවෙන් යවනු ලබන අපනයන භාණ්ඩ වූයේ චිත්‍රපට නාට්‍ය ගායක වාදක පිරිස් හැරුණු විට නවතම අපනයන භාණ්ඩය (මෙහි සිට බලන විට ආනයන භාණ්ඩය) වූයේ අපගේ මහ සඟරුවනය. විහාරස්ථාන විවෘත කිරීමට හා මල් පූජා කිරීමට පමණක් නොව (බුදුන් කාලයේ එක තැනක රැඳී සිටියත්) වස් කාලයට පවත්වන පුද පූජා වලට සහභාගි වීමටත් වැඩම කැන කරවන භික්ෂුන්ය.

හිටිවන අන්දරේලාට ඒ කාටත් වඩා ඉල්ලීමක් අලෙවියක් තිබිය හැකි බ වමට සිතෙයි. සිංහලෙන් පමණක් සිය රැඟුම් ඉදිරිපත් කරන නළු නිළියන් ඉංග්‍රීසියෙන්ද ඒ කාරිය ඉටු කිරීමට පුරුදු පුහුණු විය යුතුය. මෙරටට අවුත් අපේ ජන කොටස පමණක් නොව ඒ මාධ්‍යයට වඩා හුරුව සිටින සෙසු ජනයාද පිනවීමට ඔවුන් සමත්වනු නොඅනුමානය.

විදේශ සංචාරය එක පැත්තක් පමණි. ඔවුන් විසින් සිය මව් බිම වෙනුවෙන් මව් බිම තුළදීම ඉටු කළ හැකි ජාතික මෙහෙවර ඊට වඩා වැදගත්ය. පලදායී එකක්ද වන්නේය. ඒ සඳහා ඔවුන් දෙමළ බස හොඳින් හදාළ යුතුය. වේදිකාව වෙත ජාතික සමගිය ගොඩ නංවන දේශපාලකයන්ට වඩා හොඳට වේදිකාව ඔස්සේ ජාතික සමගිය වෙනුවෙන් අහුපෑවත ඇති යමක් කිරීමටද ඔවුන් සමත් වනු ඇත . ඒ වූකලී සද්ද බද්ද නොකර හීන් සීරුවේ ඉටු කරන - අල්ලා සිටින - ජාතික සේවයක් වන බව කිව යුතුය.

ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises

**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au